**(රාජ්‍ය / අර්ධ රාජ්‍ය නිලධාරීන් / බාහිර පුද්ගලයින් සඳහා)**

අවසාන දිනය - **2026.07.20**

# ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

"මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියේ (KMTTDP)" පහත තනතුරු සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධාරීන් ඇතුළු ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ මාර්ග ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මහනුවර ප්‍රදේශය පදනම් කරගත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවන ලදී. මෙම පත්වීම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2026.03.28 දින නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි විධිවිධානවලට යටත් වේ.

**ව්‍යාපෘතියේ නම - මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය**

**(ඇමරිකානු ඩොලර් මිලියන 25-200 කාණ්ඩය)**

| අංකය | තනතුරු නාමය | කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: **02/2026** ට අනුව වැටුප් කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ප්‍රමාණ සමීක්ෂක | D | 01 |
| 02 | ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරී | E | 01 |
| 03 | ප්‍රවාහන නිලධාරී | F | 01 |
| 04 | සැළසුම් ශිල්පී | F | 01 |
| 05 | තාක්ෂණික නිලධාරී | F | 01 |

**ඉහත සඳහන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 2/2026 හි ඇමුණුම 01 ට අනුව, ප්‍රමාණ සමීක්ෂක (D) (ඇමරිකානු ඩොලර් මිලියන 25 - 200 කාණ්ඩය) මූලික සුදුසුකම් පහත දැක්වේ.**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [(1) හෝ (2) පහතින්]**

**01.**

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්.

සහ

- ආශ්‍රිත සාමාජිකත්වය/ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්.

  සමඟ

- අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක පළපුරුද්දක්

**02**.

රජයේ දීප ව්‍යාප්ත සේවා ආයතනයක II/III හෝ ඊට ඉහළ පන්තියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්වයක්

සහ

- අදාළ ක්ෂේත්‍රයේ II/III පන්තියේ තනතුරක හෝ ඒ හා සමාන තත්වයක අවම වශයෙන් වසර 06 ක පළපුරුද්දක්

**ඉහත සඳහන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 2/2026 හි ඇමුණුම 01 ට අනුව, ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරී (E) (ඇමරිකානු ඩොලර් මිලියන 25 - 200 කාණ්ඩය) මූලික සුදුසුකම් පහත දැක්වේ.**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [(1) හෝ (2) හෝ (3) පහතින්]**

**01.**

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

  හෝ

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද, තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

  සහ

- අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද

**02.** තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

- අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක පළපුරුද්ද

**03.** තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

- අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද

**ඉහත සඳහන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 2/2026 හි ඇමුණුම 01 ට අනුව, ප්‍රවාහන නිලධාරී, සැළසුම් ශිල්පී, තාක්ෂණික නිලධාරී (F) (ඇමරිකානු ඩොලර් මිලියන 25 - 200 කාණ්ඩය) මූලික සුදුසුකම් පහත දැක්වේ.**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [(1) හෝ (2) හෝ (3) පහතින්]**

**01.**

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්.

හෝ

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද, තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

- අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 02 ක පළපුරුද්ද

**02.** තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

- අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්ද

**03.** තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

- අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 08 ක පළපුරුද්ද

**<u>පොදු කොන්දේසි:</u>**

- බඳවා ගැනීම්, වැටුප්, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි මුදල් අමාත්‍යාංශය විසින් 2026.03.28 දින නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි දක්වා ඇති විධිවිධානවලට අනුකූල වේ.
- තෝරා ගැනීම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛ කොන්දේසි මත පදනම් වේ.
- සියලුම අයදුම්පත් මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව පුරවා අදාළ ලේඛනවල සියලුම පිටපත් යැවිය යුතුය.
- එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අපේක්ෂකයින් තෝරා ගනු ලැබුවහොත් ප්‍රදේශයේ සහ/හෝ රටේ ඕනෑම ස්ථානයක වැඩ කිරීමට එකඟ විය යුතුය.

**01.** **වයස් සීමාව:**

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධාරීන් සඳහා අවුරුදු 60 ට අඩු
- අනෙකුත් අය සඳහා අවුරුදු 64 ට අඩු

**02.** **වැටුප:**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 මත පදනම්ව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

**03.** **ඊකියා කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත සිදු වේ.

- අයදුම්කරු දැනටමත් පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන්ම රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ නම්, මෙම පත්වීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026 හි 2.3.3 ඡේදයේ සඳහන් කර ඇති නිදහස් කිරීමේ පදනම සහ සලකා බැලීමේ නිවැරදි නිදහස් කිරීමේ පදනම මත පදනම් වේ.

- අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර නොමැති සහ අයදුම්පත සමඟ නිවැරදි දත්ත ඉදිරිපත් කර නොමැති අපේක්ෂකයින් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සහ අනෙකුත් අවශ්‍යතා සපුරා නොමැති අපේක්ෂකයින් පත්වීම් සඳහා සලකා බලනු නොලැබේ.

- පත්වීම ලබා දීම හෝ නොදීම, සේවය දීර්ඝ කිරීමේ තීරණය චක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධාන අනුව අමාත්‍යාංශ ලේකම්වරයාගේ තීරණය මත සිදු කෙරේ.

**04.** **ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන්ම රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දැනටමත් දරන අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා හරහා සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026 හි 2.3.3 ඡේදයට අනුව නිත්‍ය තනතුරෙන් නිදහස් කිරීමේ කැමැත්ත සහ නිදහස් කිරීමේ පදනමේ නිර්දේශය ඇතිව එවිය යුතුය. (එසේ නොමැති නම් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

**05.** **අයදුම්පත ඉදිරිපත් කිරීම**

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අධ්‍යයන සුදුසුකම් පිළිබඳ විස්තර, මූලික උපාධියේ පිටපත, සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු සමඟ, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ලියා ඇති දැන්වීමේ දැක්වෙන තනතුරේ සහ ව්‍යාපෘතියේ නම සඳහන් කරමින්, ලියාපදිංචි තැපෑලෙන් පහත දක්වා ඇති ආකෘතියට අනුව, **ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය, "මගනැගුම මහමැදුර", අංක: 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** යන ලිපිනයට හෝ **2026.07.20** දින හෝ ඊට පෙර අමාත්‍යාංශ පරිපාලන අංශයට භාර දිය යුතුය.

**06.** විශේෂ අවධානය සඳහා

- ලබා දී ඇති ආකෘතියට අනුකූලව නිසි ලෙස පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්පත සමග සහතික පිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණක් තෝරා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.

**07.** ඕනෑම විමසීමක් සඳහා කරුණාකර අමතන්න - **011-2271048**

**08.** සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කරන ලද මෙම දැන්වීමේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල දැන්වීමේ ඇති කරුණු බලපැවැත්විය යුතුය.

අයදුම්පත් ආකෘතිය - ඇමුණුම 1

**ලේකම්**
**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය**